# දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

## දකුණු පළාත් සභා සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය පාසල්වල පවතින ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම - 2021

**දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති සිංහල සහ දෙමළ මාධ්‍ය පාසල්වල පවතින ඉංග්‍රීසි විෂයයට අදාළ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (ඇ) ශ්‍රේණියට බඳවා ගැනීම පිණිස සුදුසුකම්ලත් ඩිප්ලෝමාධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ**

### 01. යෝග්‍යතා

**1:1 - මූලික සුදුසුකම්**

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

II. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මගින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව ලබාගත් අයෙකු වීම.

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 01 ක දකුණු පළාතේ අඛණ්ඩ පදිංචියක් තිබිය යුතුය. යම් අයදුම්කරුවකු දකුණු පළාත තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අතර, පදිංචිය වෙනස් කර ඇත්නම් හෝ පිට පළාතක සිට දකුණු පළාතේ පදිංචියට පැමිණ ඇත්නම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුවන්ගේ ස්ථිර පදිංචිය සහ අයදුම්කරුගේ කලත්‍රයාගේ වසර 01 ක පදිංචිය අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබිය යුතුය.

IV. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

V. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

**1:2 - අධ්‍යාපන සුදුසුකම්**

1:2:1 ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ - 1 (ඇ) ශ්‍රේණියට බඳවා ගැනීමට අදාළව ගුරු සේවා ව්‍යවස්ථාවේ 13.11 හි දක්වා ඇති පරිදි මෙහි පහතින් දක්වා ඇති ඩිප්ලෝමාධාරියෙකු වීම.

"ඩිප්ලෝමාධාරියා යනුවෙන් සඳහන් කරන්නේ ගුරු සේවා ව්‍යවස්ථාවේ 13.14 හි සඳහන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් නොවන්නා වූද, අදාළ කාරණය සඳහා ආයතනයක් විසින් පිරිනමනු ලබන්නා වූද, දෙවසරකට නොඅඩු පාඨමාලා කාල පරාසයක් සහිත වූද, ජාතික වෘත්තීය කුසලතා මට්ටම හය (NVQ Level - VI) ට නොඅඩු තරාතිරමක වූද, ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා සම්පූර්ණ කළ සහතිකලත් පුද්ගලයෙකු වේ."

**1:2: 2. අ.පො.ස. (සා.පෙළ) දෙවරකට නොවැඩි වාර ගණනකදී මව්බස හා ගණිතය සමත්ව සම්මාන 3ක් ලබා විෂයයන් 6කින් සමත් වීම.**

**1:2:3. අ.පො.ස.(උසස් පෙළ) විභාගයෙන් එක්වරකදී විෂයයන් 3 කින් සමත්වීම.**

### 02. බඳවා ගැනීමේ ක්‍රමය

2.1 දකුණු පළාතේ ඉංග්‍රීසි විෂයය ඉගැන්වීම සඳහා සුදුසුකම්ලත් ප්‍රමාණවත් ඉංග්‍රීසි විෂයය උපාධිධාරීන් නොමැති බැවින් පවතින පුරප්පාඩු වෙනුවෙන් 2021.03.31 දිනට නියමිත සුදුසුකම් සපුරා ඇති ඩිප්ලෝමාධාරීන්ට අයදුම් කළ හැකිය.

2.2 2008.07.01 දින සිට ක්‍රියාත්මක නව ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4 වගන්තිය අනුව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකට යොමුකර එම පරීක්ෂණයෙන්ද, සමත් වන අයදුම්කරුවන්ගෙන් පමණක් පහතින් දක්වා ඇති ආකාරයට බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

2.3 ඉහත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබෙන අයදුම්පත් අනුව ඉහත 2.2 පරිදි පවත්වන තරග විභාගයෙන් ද ප්‍රායෝගික පරීක්ෂණයෙන්ද සුදුසුකම් ලබන අයදුම්කරුවන් දකුණු පළාතේ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ. අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචි අයදුම්කරුවන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාසල්වල ඇබෑර්තු සම්පූර්ණ කිරීමේදී ප්‍රථමයෙන් බඳවා ගනු ලැබේ. සුදුසුකම්ලත් අයදුම්කරුවන් අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ නොමැති නම් ප්‍රථමයෙන් ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ද දෙවනුව ඊළඟ ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින්ද වශයෙන් ආසන්නතාව පදනම් කරගෙන සුදුසුකම් සහිත අපේක්ෂකයින් අතරින් තෝරාගනු ලැබේ.

### 03. ඉල්ලුම් කිරීමේ ක්‍රමය

3.1. A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපිටම භාවිත කරමින් මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් සකස් කරගත යුතුය. 1 - 4 දක්වා කඩදාසියේ එක්පැත්තක ද 5- 12 දක්වා අනෙක් පස ද සිටින සේ පිළියෙල කර ගත යුතුය.

3.2 අදාළ ආදර්ශ ආකෘතියට නොගැළපෙන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද තමා ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා අදාළ අංකය නිවැරදිව සඳහන් කළ යුතුය. ඔබ විසින් වැරදි තොරතුරු සපයා ඇති බවට පත්වීම ලබා ගැනීමෙන් පසුව වුවද අනාවරණය වුවහොත් ඔබගේ පත්වීම අවලංගු කිරීමට යටත් වනු ඇත.

3.3 නිවැරදිව සම්පූර්ණ කරන ලද ආදර්ශ අයදුම්පත්‍රය සම්පූර්ණ කර 2021.03.31 දින හෝ ඊට පෙර "**ලේකම්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, දක්ෂිණපාය, ලබුදුව, ගාල්ල**" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**දකුණු පළාත් සභා පාසල්වල ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම - 2021**" යන්න සහ ඉල්ලුම් කරන විෂයය සඳහන් කළ යුතුය.

3.4 විභාග ගාස්තු ලෙස රු.1000/= ක මුදලක් දකුණු පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් , දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 2003.02.13 දරන අය ශීර්ෂයට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පසු පිට නොගැලවෙන සේ අලවා එවිය යුතුවේ.

3.5 තැපෑලේදී නැතිවන හෝ ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබෙන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

3.6 සැලකිය යුතුයි. අයදුම්පත්‍රය සමග විස්තරාත්මක ඩිප්ලෝමා සහතිකයේ ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම අමුණා එවිය යුතුය. එසේ නොවන්නේ නම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### 04. සේවා කොන්දේසි

4.1 මුලින් පත්වීම් ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවම වශයෙන් වසර 08 ක් සේවය කිරීම අනිවාර්ය වේ.

4.2 මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

4.3 උසස් වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදුකරනු ඇත.

4.4 පත්වීම් විෂයය කිසිදු හේතුවක් නිසා වෙනස් කරනු නොලැබේ.

4.5 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය වන ජී-ඊ-1-2016 දරන වැටුප් කාණ්ඩය (මාසික වැටුප රු. 27,740 - 6X300 - 7X380 - 2X445 -33,090 ක්) වේ. ඔබ මෙම වැටුප් පරිමාණයේ 07 වන පියවර වන රු. 29,540.00 ක මාසික වැටුප මත පිහිටුවනු ලැබේ.

### 05. විභාග ක්‍රමය

5.1 ලිඛිත තරග විභාගය

| විෂයය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය - (කාලය පැය 01යි) | 100 | 40 |
| සාමාන්‍ය දැනීම - (කාලය පැය 01යි) | 100 | 40 |

5.1.1 මෙම ලිඛිත තරග විභාගය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබේ.

5.2 මෙම සියලු තරග විභාග ගාල්ලේ දී පමණක් පවත්වනු ලැබේ.

5.3 ප්‍රායෝගික පරීක්ෂණය

අයදුම්කරු විසින් හඳුනාගත් මාතෘකාවක් යටතේ විනාඩි පහ (05) ඉදිරිපත් කිරීමක් ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් සිදුකළ යුතු වේ. මෙහිදී පහත පරිදි උපරිම ලකුණු විසිපහක් (25) ලබා දෙනු ලැබේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ටවීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

5.3.1 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය

i. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 5ක කාලයක් දෙනු ලැබේ.

ii. ප්‍රායෝගික පරීක්ෂණය ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.

iii. ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතු ය.

### 06. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

6.1 අයදුම්පත පිරවීමේදී පහත උපලේඛන 01,02 පමණක් භාවිත කළ යුතු ය.

6.2 ඔබ දැනටමත් රාජ්‍ය සේවයේ නිරත වන්නේ නම් අයදුම්පතතේහි අත්සන සහතික කිරීම

(අයදුම්පතෙහි අංක 12 හි) ඔබගේ ආයතන ප්‍රධානියා මගින්ම සිදුකළ යුතු අතර, අයදුම්පතහි පිටපත් පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම කළ යුතුය.

**උපලේඛනය 01**

| භාෂා මාධ්‍යය | කේත අංකය |
|---|---|
| සිංහල මාධ්‍යය | 2 |
| දෙමළ මාධ්‍යය | 3 |
| ඉංග්‍රීසි මාධ්‍යය | 4 |

**උපලේඛනය 02**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අංකය | | | | |
|---|---|---|---|---|---|
| අක්මීමන | -101 | නියාගම | -116 | පිටබැද්දර | -132 |
| අම්බලන්ගොඩ | -102 | තවලම | -117 | තිහගොඩ | -133 |
| බද්දේගම | -103 | වැලිවිටිය - දිවිතුර | -118 | වැලිගම | -134 |
| බලපිටිය | -104 | යක්කලමුල්ල | -119 | වැලිපිටිය | -135 |
| බෙන්තොට | -105 | අකුරැස්ස | -120 | අම්බලන්තොට | -136 |
| බෝපේ - පෝද්දල | -106 | අතුරලිය | -121 | අගුණුකොලපැලැස්ස | -137 |
| ඇල්පිටිය | -107 | දෙවිනුවර | -122 | බෙලිඅත්ත | -138 |
| ගාල්ල | -108 | දික්වැල්ල | -123 | හම්බන්තොට | -139 |
| ගෝනපීනුවල | -109 | හක්මන | -124 | කටුවන | -140 |
| හබරාදුව | -110 | කඹුරුපිටිය | -125 | ලුණුගම්වෙහෙර | -141 |
| හික්කඩුව | -111 | කිරින්ද පුහුල්වැල්ල | -126 | ඕකෙවෙල | -142 |
| ඉමදුව | -112 | කොටපොල | -127 | සූරියවැව | -143 |
| කරන්දෙණිය | -113 | මාලිම්බඩ | -128 | තංගල්ල | -144 |
| නාගොඩ | -114 | මාතර | -129 | තිස්සමහාරාමය | -145 |
| නෙළුව | -115 | මුලටියන | -130 | වලස්මුල්ල | -146 |
| | | පස්ගොඩ | -131 | වීරකැටිය | -147 |

08. මෙම නිවේදනයේ ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතියද, බඳවා ගැනීමේ ක්‍රමයට අදාළ කොන්දේසි සංශෝධන ද , කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම පිළිබඳව අවසන් තීරණය ගැනීම දකුණු පළාත් අධ්‍යාපන ලේකම් විසින් සිදු කරනු ලැබේ.

**රංජිත් යාපා,**
**ලේකම්,**
**දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය.**

---

## දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

## අයදුම්පත්‍රය

**කාර්යාල ප්‍රයෝජනය සඳහා** [ ]

## "දකුණු පළාත් සභා සිංහල මාධ්‍ය සහ දෙමළ මාධ්‍ය පාසල්වල පවතින ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම - 2021"

| | |
|---|---|
| ස්ථිර පදිංචි පළාත | |
| ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | |
| ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අංකය | |

01. 5.1 හි දක්වා ඇති විභාගයට ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍ය
(අදාළ අංකය ගැසට් නිවේදනයේ උපලේඛන 01 අනුව කොටුව සම්පූර්ණ කරන්න)

02. 2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදා ; ELLALAGODA GAMAGE HIMALI)
..........................................................
..........................................................

2.2 අගට යොදන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදා : HIMALI G)
..........................................................
..........................................................

2.3 සම්පූර්ණ නම (සිංහල අකුරින්)
(උදා ඇල්ලලගොඩ ගමගේ හිමාලි)
..........................................................

2.4 අගට යොදන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (සිංහල අකුරින්)
(උදා : හිමාලි ඊ. පී.)
..........................................................

03. 3.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
..........................................................
..........................................................

3.2 ස්ථිර ලිපිනය (සිංහල අකුරින්)
..........................................................
..........................................................
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

04. 4.1 ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | | | ]

4.2 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

4.3 2021.03.31 දිනට වයස අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

4.4 ස්ත්‍රී/ පුරුෂ භාවය - [ ] ස්ත්‍රී - 1 පුරුෂ - 2 (අදාළ අංකය යොදා සම්පූර්ණ කරන්න)

4.5 දුරකථන අංක : [ | | | | | | | | | ]
[ | | | | | | | | | ]

05. උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තරය

5.1 ඩිප්ලෝමාව : ..........................................................

5.2 නිකුත් කළ ආයතනය : ..........................................................

5.3 ඩිප්ලෝමාව වලංගු දිනය : ..........................................................

5.4 කාල සීමාව : ..........................................................

06. 6.1 ගෙවා ඇති විභාග ගාස්තු රුපියල් (අකුරින්) : ..........................................................

6.2 කුවිතාන්සියේ අංකය : ..........................................................

6.3 නිකුත් කල කාර්යාලය : ..........................................................

6.4 නිකුත් කළ දිනය : ..........................................................

07. ඔබ ආබාධිත තත්ත්වය යටතේ අයදුම්කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න
..........................................................

08. ඔබ සාපරාධී වරදක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවකු කර ඇති අයකේද? (ඔව්/ නැත)

09. එසේම ඔබ කිසියම් වරදක් සම්බන්ධව රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ පුද්ගලයෙක්ද? (ඔව්/ නැත)

10. උක්ත 08 ට හෝ 09 ට පිළිතුර? "ඔව්" නම් විස්තර සපයන්න.
..........................................................
..........................................................
..........................................................
..........................................................

**කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබාගන්න**
**මුදල් කුවිතාන්සියේ මුල් පිටපත නොගැලවෙන සේ මෙහි අලවන්න.**

11. අයදුම්කරුගේ / අයදුම්කාරියගේ ප්‍රකාශය

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් සියලුම කොන්දේසි හා නියමයන් කියවා තේරුම්ගත් අතර එම කොන්දේසි හා නියමයන්ට එකඟව මෙම අයදුම්පත ඉදිරිපත් කරන බවද ප්‍රකාශ කරමි. එසේම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නම් කරන ඕනෑම පාසලක සේවය කිරීමට කැමැත්තෙමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව ගුරුපත්වීමක් ලබාගැනීමට නුදුසුදු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මම දනිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට යටත් බවද මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරන බවද ප්‍රකාශ කරමි.

..........................................................  ..........................................................
දිනය  අයදුම්කරුගේ අත්සන

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන.......................... හිමි/ මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවද හිමි/ ඔහු/ ඇය මා ඉදිරිපිටදී ...................... දින හිමිගේ / ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

..........................................................  ..........................................................
දිනය  සහතික කරන නිලධාරියාගේ /ආයතන ප්‍රධානියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ..........................................................
තනතුර : ..........................................................
ලිපිනය : ..........................................................